## අධ්‍යාපන අමාත්‍යාංශය

### සාමාන්‍ය කලා යෝග්‍යතා (බාහිර) පරීක්ෂණය (ඉංග්‍රීසි විෂය සහිතව) සහ විද්‍යාවේදී (බාහිර) උපාධි පළමු පරීක්ෂණය සමත් ගුරුවරුන් විශ්වවිද්‍යාලවලට ඇතුළත් කිරීම - 2017/2018 අධ්‍යයන වර්ෂය

2017/2018 අධ්‍යයන වර්ෂය තුළ පහත සඳහන් පාඨමාලා හැදෑරීම පිණිස ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාලවලට ඇතුලත් කර ගැනීම සඳහා සාමාන්‍ය කලා යෝග්‍යතා (බාහිර) පරීක්ෂණය (ඉංග්‍රීසි විෂය සහිතව) සහ විද්‍යාවේදී (බාහිර) උපාධි පළමු පරීක්ෂණය සමත් රජයේ හෝ රජය අනුමත කරන ලද පෞද්ගලික පාසල්වල සේවය කරන ගුරුවරුන්ගෙන් අයදුම්පත් භාර ගනු ලැබේ.

(i) ඉංග්‍රීසි විෂය සහිත කලා උපාධි පාඨමාලාව
(ii) විද්‍යාවේදී උපාධි පාඨමාලාව

2. ඉල්ලුම්කරුවන් මේ සඳහා පහත සඳහන් සුදුසුකම් සපුරා තිබිය යුතුයි.

(i) 2013 වර්ෂයේ හෝ ඊට පසු වර්ෂයකදී පැවැත්වූ සාමාන්‍ය කලා යෝග්‍යතා (බාහිර) පරීක්ෂණය (ඉංග්‍රීසි විෂය සහිතව) හෝ විද්‍යාවේදී (බාහිර) උපාධි පළමු පරීක්ෂණය සමත්ව තිබිය යුතුය. (ප්‍රතිඵල ලේඛනයේ පිටපතක් අයදුම්පතට ඇමිණිය යුතුය.)

(ii) අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට ගුරුවරයෙකු වශයෙන් අවුරුදු 05 ක සේවා කාලයක් සම්පූර්ණ කර තිබිය යුතුය. අදාළ ගුරු පත්වීම ස්ථිර කර තිබිය යුතුය.

(iii) දැනටමත් ගුරු අභ්‍යාස විද්‍යාලයක, ජාතික අධ්‍යාපන විද්‍යා පීඨයක, විශ්වවිද්‍යාලයක හෝ ජාතික අධ්‍යාපන ආයතනයේ පාඨමාලා හැදෑරීම සඳහා ලියාපදිංචි වී නොසිටිය යුතුය.

(iv) මෙම විශේෂ ප්‍රවේශය යටතේ සිසුන් තෝරා ගනු ලබනුයේ සාමාන්‍ය කලා යෝග්‍යතා (බාහිර) පරීක්ෂණයේදී (ඉංග්‍රීසි විෂය සහිතව) හෝ විද්‍යාවේදී (බාහිර) උපාධි පළමු පරීක්ෂණයේදී ලබා ගත් මුළු ලකුණු සහ අදාළ විෂයයට ලබාගත් ලකුණු පදනම් කරගෙනය. මෙයට අමතරව අදළ විශ්වවිද්‍යාල මගින් තීරණය කරනු ලබන පරිදි විද්‍යාවේදී උපාධි පාඨමාලාව හැදෑරීම සඳහා සුදුසුකම් ලබන අයදුම්කරුවන් එම විශ්වවිද්‍යාල මගින් වාචික පරීක්ෂණයකට භාජනය කෙරෙන අතර කලා උපාධි පාඨමාලාව හැදෑරීම සඳහා සුදුසුකම් ලබන අයදුම්කරුවන් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මගින් සම්මුඛ පරීක්ෂණයකට භාජනය කෙරේ.

(v) මෙම පාඨමාලා හැදෑරීම සඳහා තෝරා ගනු ලැබුවහොත් ඔවුනට අධ්‍යයන නිවාඩු ලබා දිය යුතු බැවින් එසේ අධ්‍යයන නිවාඩු හිමිකම් ඇති ගුරුවරුන් පමණක් මේ සඳහා අයදුම් කළ යුතුය.

3. වැටුප් සහිත අධ්‍යයන නිවාඩු ලබා ගැනීමට ඇති හිමිකම පිළිබඳව සම්මුඛ පරීක්ෂණයේ දී විමසා බලනු ලැබේ.

4. උපාධි ලබා ගැනීමෙන් අනතුරුව උපාධි ගුරු පත්වීම් ලබාදීම පිළිබඳව වගකීමට මෙම අමාත්‍යාංශය බැඳී නැත.

5. රජය අනුමත කරන පෞද්ගලික පාසල්වල සේවය කරන ගුරුවරුන් විසින් ඉදිරිපත් කරන අයදුම්පත්වල එම පාසලේ විදුහල්පති/කළමණාකරන තැන විසින් අදාළ ගුරුවරිය/ගුරුවරයා සඳහා අධ්‍යයන නිවාඩු අනුමත කළ හැකි/නොහැකි බව ඉල්ලුම් පත්‍රයේ සඳහන් කළ යුතුය.

6. රජයේ ගුරුවරුන්ගේ අයදුම්පත් විදුහල්පති, කලාප භාර අධ්‍යාපන අධ්‍යක්ෂ හා පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ විසින්ද, රජය අනුමත කරන ලද පෞද්ගලික පාසල්වල ගුරුවරුන්ගේ අයදුම්පත් අදාළ විදුහල්පති/කළමනාකරණ තැන විසින් ද සහතික කළ යුතුය.

සෑම අයදුම්පතක්ම මෙහි පහත සඳහන් ආදර්ශ ආකෘති පත්‍රයට අනුව පිළියෙල කොට පිටපත් දෙකකින් (02) යුතුව 2018.06.29 දිනට පෙර ලේකම්, අධ්‍යාපන අමාත්‍යාංශය, ඉසුරුපාය, බත්තරමුල්ල ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපැලෙන් එවිය යුතුවේ. අයදුම්පත් බහා එවන කවරයේ වම් පස ඉහළ කෙළවරේ "ශ්‍රී ලංකා විශ්වවිද්‍යාලවලට ඇතුළත්වීම සඳහා අයදුම්පත් - 2017/2018 (ගුරුභවතුන් සඳහා)" යනුවෙන් සඳහන් කළ යුතුය.

සුනිල් හෙට්ටිආරච්චි,
ලේකම්.

### ආදර්ශ අයදුම්පත්‍රය

*අධ්‍යාපන අමාත්‍යාංශය*

(කාර්යාලීය ප්‍රයෝජනය සඳහා)

| |
|---|
| |

*සාමාන්‍ය කලා යෝග්‍යතා (බාහිර) පරීක්ෂණය (ඉංග්‍රීසි විෂය සහිතව) හෝ විද්‍යාවේදී (බාහිර) උපාධි පළමු පරීක්ෂණය සමත් ගුරුවරුන් විශ්වවිද්‍යාලවලට ඇතුළත් කිරීම 2017/2018 අධ්‍යයන වර්ෂය*

1. (i) මුලකුරු සමග නම :————.
   (ii) සම්පූර්ණ නම :————.

2. (i) ජාතික හැඳුනුම්පත් අංකය :————.
   (ii) ස්ත්‍රී/පුරුෂ භාවය :————.

3. (i) තනතුර :————. (ii) ශ්‍රේණිය :————.

4. ලිපිනය :
   (i) රාජකාරී :————.
   (ii) පෞද්ගලික :————.

5. දුරකථන අංකය : (i) ස්ථාවර :———. (ii) ජංගම :———.

6. විද්‍යුත් ලිපිනය (E-mail) :————.

7. වර්තමාන සේවා ස්ථානය :
   (i) පාසල :————.
   (ii) කලාපය :————.
   (iii) දිස්ත්‍රික්කය :————.
   (iv) පළාත :————.

8. (i) මුල් පත්වීම් දිනය :
   (ii) ස්ථිරත්වය ලද දිනය :
   (iii) සේවා කාලය (මුල් පත්වීමේ සිට අයදුම්පත් භාරගන්නා අවසන් දිනට) :

   වර්ෂ :————. මාස :————. දින :————.

9. ගුරුවරයෙකු වශයෙන් ලියාපදිංචි අංකය :————.

10. (i) උපන් දිනය :
    වර්ෂය :————. මාසය :————. දිනය :————.
    (ii) වයස (අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට) :
    වර්ෂ :————. මාස :————. දින :————.

11. සුදුසුකම් ලබන විභාගය පිළිබඳ විස්තර (විශ්වවිද්‍යාලය මගින් නිකුත් කරන ලද අදාළ ප්‍රතිඵල ලේඛනයේ සහතික කරන ලද පිටපතක් අයදුම්පත සමග ඉදිරිපත් කළ යුතුයි.)
    (i) විභාගය :————.
    (ii) විශ්වවිද්‍යාලය :————.
    (iii) ප්‍රතිඵල :

| | *විෂයය* | *සමත්වූ වර්ෂය* | *ලකුණු* | *ශ්‍රේණිය* |
|---|---|---|---|---|
| 1. | | | | |
| 2. | | | | |
| 3. | | | | |
| 4. | | | | |
| 5. | | | | |

12. හැදෑරීමට අපේක්ෂිත උපාධි පාඨමාලාව සහ විෂයයන් :

    (i) උපාධි පාඨමාලාවේ නම :————.

    (ii) විෂයයන් : (1) :————.
    (2) :————.
    (3) :————.

13. මෙම ප්‍රවේශය යටතේ ඔබව තෝරා ගතහොත් ඇතුළත්වීමට අපේක්ෂා කරන විශ්වවිද්‍යාලවල නම් ඔබගේ කැමැත්තේ අනුපිළිවෙලට සඳහන් කරන්න
    (1) :———. (3) :———.
    (2) :———. (4) :———.

14. ඔබ ගුරු අභ්‍යාස විද්‍යාලයක/අධ්‍යාපන පීඨයක/විශ්වවිද්‍යාලයක හෝ ජාතික අධ්‍යාපන ආයතනයේ වෙනත් පාඨමාලාවක් සඳහා ලියාපදිංචි වී සිටීද ?

    එසේ ලියාපදිංචි වී ඇත්නම් ඒ පිළිබඳ විස්තර :————.

    ඉහත සඳහන් තොරතුරු සත්‍ය හා නිවැරදි බවට සහතික කරමි.

————,
අයදුම්කරුගේ අත්සන

දිනය :————.

.............................. හිමි/මයා/මිය/මෙනවිය ............ දින සිට ................. ලෙස (තනතුර/ශ්‍රේණිය) ........................ විද්‍යාලයේ සේවය කරන බවත් ඔහුට/ඇයට පෙර මාසයේ වැටුප ගෙවන ලද්දේ මෙම පාසැලෙන් බවත්, යථෝක්ත අධ්‍යයන පාඨමාලාව හැදෑරීම සඳහා තෝරාගතහොත් ඔහු/ඇය නිදහස් කළ හැකි/නොහැකි බවත් සහතික කරමි.

අයදුම්කරුට/අයදුම්කාරියට අවශ්‍ය අධ්‍යයන නිවාඩු ලබාදීම නිර්දේශ කරමි/නොකරමි. (අධ්‍යයන නිවාඩු නිර්දේශ නොකරන්නේ නම් හේතු දක්වන්න) :————.

නිර්දේශ කරමි/නොකරමි.

————,
විදුහල්පති.
(අත්සන හා නිලමුද්‍රාව)

දිනය :————.

නිර්දේශ කරමි/නොකරමි.

————,
කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ.
(අත්සන හා නිලමුද්‍රාව)

දිනය :————.

නිර්දේශ කරමි/නොකරමි.

————,
පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ.
(අත්සන හා නිලමුද්‍රාව)

දිනය :————.

06-280